# මිහින්තලේ වසම්මලේ ලෙන සිතුවම් පිළිබඳව අධ්‍යයනයක්

කෝණකුඹුක්වැවේ පඤ්ඤාලෝක හිමි

පුරාවිද්‍යා අධ්‍යයනය අංශය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය
kpagngnaloka08@gmail.com

---

වසම්මලේ කන්ද, මිහින්තලයට උතුරු දෙසින් රජරට විශ්වවිද්‍යාලයට උතුරු සීමාවේ පිහිටි කුඩා කඳුගැටයකි. මිහින්තලය ආංශුක පුරාක්ෂේත්‍රය නියෝජනය කරන මෙහි උතුරු බෑවුමේ 'චිත්‍ර ගල' ලෙස හඳුන්වනු ලබන පාෂාණ උද්ගතය ආශ්‍රයෙන් නිර්මාණය වූ අඩි 50 දිගින් යුත් පටු පර්වත පියස්සෙහි ලෙන් බිත්තිය මතුපිට මීටර 4 x මීටර 3 ප්‍රමාණයේ අවකාශයක මෙම සිතුවම් හා බදාම කොටස් ව්‍යාප්තව පවතියි. බෙහෙවින් විනාශයට පත්වීම නිසා වර්තමානය වන විට එහි දැකගත හැකි වනුයේ පෙණගොබ කිහිපයක් සහිත් විශාල නාග රූපයක කොටසක්, ඊට පහතින් යෝගියෙකු නිරූපණය කරන බව සිතිය හැකි රේඛා සටහනක් හා කුඩා ප්‍රමාණයේ නාග කන්‍යාවකගේ සිතුවමක් පමණකි. 1968 වර්ෂයේ දී මෙම සිතුවම් හඳුනාගනු ලැබුව ද ඒ පිළිබඳව සිදුකර ඇති පර්යේෂණ සීමා සහිත වේ. ආරිය ලගමුව මහතා වසම්මලේ ලෙන් සිතුවම් ක්‍රි.ව. 4-7 සියවස්වලට කාල නිර්ණය කරන අතර නාග ලෝකයේ අවස්ථාවක් නිරූපණය කරන බව උපකල්පනය කරයි. නමුත් මූලාශ්‍ර පරිශීලනයේ දී සිතුවම්වල සංකල්පීය පදනම, වස්තු විෂය හා කාලනිර්ණය පිළිබඳව නව මතයක් ගොඩනැඟිය හැකි බව පෙනේ.

ක්‍රි.ව.දහවන සියවසට කාලනිර්ණය කර ඇති මිහින්තලා පුවරු ලිපියේ එන ආයතන කිහිපයක ප්‍රතිසංස්කරණ සඳහා සිදු කළ ප්‍රදානයක් පිළිබඳව කියවෙන පුවත මෙහි දී වැදගත් වේ. ප්‍රදානය ලත් ආයතන අතර 'මණිනාල් දෙව් දූ ගෘහය' හා 'නාගේන්ද්‍ර' නම් වූ සිද්ධස්ථානයකි. මේවා මිහින්තලය අවට ප්‍රදේශයේ පැවති බව උපකල්පනය කළ හැකි වනුයේ ලිපියේ සඳහන් ගිරිහඬු වෙහෙර, ඇත් වෙහෙර වැනි සෙසු ස්ථාන තදාශ්‍රිත ප්‍රදේශයෙන් හඳුනාගෙන ඇති හෙයිනි. මනිනාල් දෙවු දූ යනු අවලෝකිතේශ්වර බෝධිසත්වයන්ගේ ශක්තිය වූ තාරා දෙවු දූ හැඳින්වීම සඳහා භාවිත අන්වර්ථ නාමයකි. ක්‍රි.ව.7-8 සියවස් වන විට මිහින්තලය ආශ්‍රිතව මහායාන අදහස් වර්ධනය වීම හා සාපේක්ෂව බෝධිසත්ත්ව ශක්තීන් වන්දනය ද ජනප්‍රිය වූ බව පෙනේ. තව ද ක්‍රිස්තු පූර්ව යුගයේ සිට නාගයා පූජනීය සත්ත්වයෙකු ලෙස ජනවිඥාන ගත වී තිබේ. එබැවින් වසම්මලේ සිතුවම් තුළින් ද මහායානික හා ජනවිඥානගත සංකල්ප පරියාය වශයෙන් නිරූපණය වන බව අපගේ අදහස වේ.

එබැවින් මෙම සිතුවම් සඳහා මහායාන සාහිත්‍යයේ එන අවස්ථාවක් වස්තු විෂයය වී ඇති බව උපකල්පනය කළ හැකි ය. ජනාවාසයක් සඳහා නුසුදුසු පටුපර්වත පියස්ස ආවරණය කර බිත්ති බැඳ තිබූ බවට සාධක පැවතීමෙන් ලිපියේ එන නාගේන්ද්‍ර සිද්ධස්ථානය හෝ මනිනාල් දෙව් දූ ගෘහය වුව ද මෙය වීමට ඉඩ තිබේ. එබැවින් මෙම සිතුවම්වල කාලනිර්ණය ක්‍රි.ව. 7-9 සියවස්වලට වඩා පැරණි අවධියකට නොයන බව අදහස වේ. ප්‍රස්තුත තොරතුරු මත පදනම් ව වසම්මලේ ලෙන්සිතුවම්වල සංකල්පමය, ඓතිහාසික, කලාත්මක මෙන් ම විද්‍යාත්මක සන්දර්භය පිළිබඳව තවදුරටත් පුළුල් විමර්ශනයක නිරතවීමට මෙම අධ්‍යයනය තුළින් අපේක්ෂා කෙරේ.

ප්‍රමුඛ පද : වසම්මලේ, ලෙන් සිතුවම්, නාග වන්දනය, මහායාන සංකල්ප